**නිවිතිගල ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**--------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**---------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 18 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට නිවිතිගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුල ඉදිකිරීම් අවසන් කර සභාව වෙත පවරා දී තිබූ නිවිතිගල සතිපොළ හා බස් නැවතුම්පල ප්‍රාග්ධනිත කර නොතිබීම හේතුවෙන් දේපල පිරියත හා උපකරණ රු. 78,223,877 ක් අඩුවෙන් දැක්වුණි.

(ආ) ස්ථාවර වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් වැය කර තිබුණු රු. 27,725 ක් පුනරාවර්තන වියදම් වශයෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මෙහෙයුම් අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ඇ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳුණු ගිණුම්
**-----------------------**

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 06 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 12,549,287 ක වෙනසක් විය.

#### 1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
**----------------------------------------------------**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 74,841,186 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | (i) මුදල් රෙගුලාසි 371 | 200,000 | හංගමුව ලබුවත්ත පන්සල මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය සඳහා 2010 පෙබරවාරි මස ලබා දී තිබූ අත්තිකාරම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | 748,170 | 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ 5(5) වන අතුරු ව්‍යවස්ථාව | - | සමාලෝචිත වර්ෂය තුල හඳුනාගන්නා ලද අනවසර ඉදිකිරීම් 09 ක් ඉවත් කර ගන්නා ලෙස හෝ නියමානුකූල කර ගන්නා ලෙස ලිඛිත දැනුම්දීම් සිදුකර තිබුණද, ඊට ප්‍රතිචාර දක්වා නොතිබූ අතර, සභාව විසින් එම ඉදිකිරීම් ඉවත් කර නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | - | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඈ) | 2017 පෙබරවාරි 08 දිනැති අංක 02/2017 දරන සබරගමු පළාත් සභාවේ පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය | 316,376 | අදාළ භාණ්ඩ සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් සිටියදී ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ මිලදී ගෙන තිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,650,864 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,434,016 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,122,403 | 3,043,121 | 3,138,589 | 1,402,095 | 2,524,905 | 2,846,862 | 3,332,502 | 1,518,263 |
| කුලී | 4,165,100 | 4,097,000 | 4,053,050 | 105,950 | 4,076,500 | 3,881,850 | 3,907,050 | 62,000 |
| බලපත්‍ර ගාස්තු | 406,900 | 380,210 | 376,710 | 5,000 | 272,600 | 334,656 | 334,656 | 1,500 |
| වෙනත් ආදායම් | 14,435,800 | 14,977,031 | 10,213,649 | 14,157,014 | 10,432,983 | 10,748,111 | 7,125,533 | 9,393,632 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු යන ආදායම් විෂයයේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා සියයට 01 කින් වැඩි වී තිබූ අතර බදුකුලී ආදායම, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු, වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් හා රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 03, සියයට 07, සියයට 04, සියයට 57, සියයට 23 හා සියයට 30 කින් අඩුවී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

#### (අ) වරිපනම්

2017 දෙසැම්බර් 31 දිනට වරිපනම් ඒකක 805 කින් එකතුව රු. 1,166,947 ක වරිපනම් ශේෂයක් සභාව වෙත අයවීමට තිබූ අතර, එම ශේෂය තුල හිඟ කාලය වසර 05 ට වඩා වැඩි වරිපනම් ඒකක 198 කින් අයවිය යුතු රු. 471,188 ක ශේෂයක් පැවතුණි. එම හිඟ වරිපනම් අයකර ගැනීම සම්බන්ධයෙන් සභාවේ ක්‍රියාකාරීත්වය දුර්වල තත්ත්වයක විය.

#### (ආ) අක්කර බදු

2017 දෙසැම්බර් 31 දින වනවිට අයවිය යුතු හිඟ අක්කර බදු ශේෂය රු. 90,862 ක් වූ අතර, ඉන් එකතුව රු. 75,871 ක් වසර 05 ට වඩා වැඩි පැරණි ශේෂ විය. අදාල හිඟ බදු අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල මට්ටමක පැවතුණි.

**2.2.4 වෙනත් ආදායම්**

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවිය යුතු එකතුව රු. 259,690 ක ව්‍යාපාර බදු අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර තිබුණු දැන්වීම් පුවරු වෙනුවෙන් අයවිය යුතු රු. 34,070 ක ගාස්තු 2018 අප්‍රේල් වනවිටත් අයකරගෙන නොතිබුණි.

**2.2.5 මුද්දර ගාස්තු**

---------------

2015 ජනවාරි සිට 2017 දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල හිඟ මුද්දර ගාස්තු හඳුනාගෙන අයකර ගැනීමට අපොහොසත්ව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 කාර්යසාධනය**

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

-------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(ix)(ආ) වගන්තිය ප්‍රකාරව මලාපවහනය සහ කසළ ශෝධනය හා ඒ සඳහා ගාස්තු අයකිරීම, අතුරු ව්‍යවස්ථා වලට විෂයය වන කරුණක් වශයෙන් දක්වා තිබුණද, සභාව විසින් කසළ ශෝධනය සම්බන්ධයෙන් ගාස්තු අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ක්‍රියාත්මක නොකල කර්තව්‍යයන්**

--------------------------------------

අඩු ආදායම්ලාභීන් සඳහා වැසිකිළි පහසුකම් සැපයීම හා අඩු ආදායම්ලාභී පවුල් වල ළමුන්ට පාසැල් උපකරණ ලබාදීම වෙනුවෙන් වාර්ෂික ඇයවැය ලේඛනය මඟින් රු. 55,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, එකී සුභසාධන කටයුතු කිසිවක් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි. කෙසේ වුවද, "ආධාර ලබාදෙන ලෙස ප්‍රාදේශීය සභාව වෙත කරන ලද ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා ගැනීමට පළාත් පාලන සහකාර කොමසාරිස් මඟින් විෂයය භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කලද එම ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා නොදීම නිසා සමාලෝචිත වර්ෂය තුල සුභසාධන කටයුතු කිසිවක් කිරීමට නොහැකි" වූ බවට විගණනය වෙත දන්වා තිබුණි.

**(ඇ)** **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

----------------------------------

සභාව විසින් රැස්කරන දිරන කසළ කළමනාකරණය සඳහා ඉඩමක් අත්පත් කරගැනීමට අපොහොසත් වීම හේතුවෙන් විධිමත් කසළ කළමනාකරණ වැඩපිළිවෙලක් සැලසුම්කර ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

**(ඈ)** **තිරසර සංවර්ධන ඉලක්ක**

-----------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල ලැබී තිබුණු එකතුව රු. 150,766 ක් වූ ගෙවල් කුලී අදාල නිවාස හිමිකරුවන් වෙත ගෙවීම් කිරීමකින් තොරව තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**3.3** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1986 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් සහ ගොඩනැගිලි නියෝගයන්ට කරන ලද සංශෝධනයන්හි V වන උපලේඛනය පරිදි දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීමේදී අයකල යුතු ගාස්තු වලට පටහැනි ලෙස දුරකථන කුළුණු 06 කින් අඩුවෙන් ගාස්තු අයකර තිබීම හා දුරකථන කුළුණු 03 කින් කිසිදු ගාස්තුවක් අයකර නොතිබීම හේතුවෙන් 2018 මැයි වනවිට රු. 1,201,200 ක් අයවිය යුතුව පැවතුණි.

(ආ) ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු. 43,290 ක් වූ පොල්වත්ත ගෙපල මාර්ගය කැඩී ගිය ස්ථානය හා ගලඋඩවත්ත පාර කැඩී ගිය ස්ථානය ප්‍රතිසංස්කරණය සඳහා 2017 පෙබරවාරි 22 දින පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ඉල්ලා තිබුණද, 2018 අප්‍රේල් වනවිටත් එකී අනුමැතිය ලැබී නොතිබුණි. අදාල ප්‍රතිසංස්කරණ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් එම මාර්ග තවදුරටත් කැඩී යාමේ අවදානමට ලක්ව තිබුණු අතර, ප්‍රතිසංස්කරණය සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදුවීමේ අවදානමක් පැවතුණි.

**3.4** **වත්කම් කළමනාකරණය**

----------------------------

**(අ)** **පවරා නොගත් වත්කම්**

--------------------------

සභාවට අයත් සුසාන භූමි වල අයිතිය පවරා ගැනීමේ කටයුතු වෙනුවෙන් වාර්ෂික අයවැය ලේඛනයෙන් රු. 400,000 ක ප්‍රතිපාදන සලසා දී තිබුණද, සමාලෝචිත වර්ෂය තුල ඒවා පවරා ගැනීමට අපොහොසත් වී තිබුණි.

**(ආ)** **නිෂ්ක්‍රීය වත්කම්**

**------------------**

කැබ් රථයක් හා ට්‍රැක්ටරයක් අළුත්වැඩියා කිරීම සඳහා 2015 මැයි මාසයේදී සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත භාරදී තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අළුත්වැඩියා කර නොතිබුණි. වර්ෂ දෙකකට අධික කාලයක සිට අක්‍රියව පවතින එම වාහන කඩිනමින් අළුත්වැඩියා කරගැනීම හෝ එසේ නොහැකි නම් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.5** **ප්‍රසම්පාදනය**

**---------------**

**ප්‍රසම්පාදන සැලැස්ම**

**-----------------------**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**-----------------------------------------**

**4.1** **අයවැය පාලනය**

**------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වැය විෂයයන් 33 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 2,391,167 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී පැවතුණි.

(ආ) වැය විෂයයන් 12 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 21,819,346 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 80 සිට සියයට 96 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි.

**4.2** **විගණන හා කළමනාකරණ කමිටු**

**--------------------------------------**

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

**--------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) වියදම් හඳුනා නොගැනීම |
| | | (ii) ආදායම් වැඩියෙන් සටහන් කිරීම |
| | | (iii) ලෙජර් ගිණුම් හා උපයෝගී ලේඛන නොසැසඳීම |
| (ආ) | ආදායම් පරිපාලනය | නියමිත ආදායම අයකර නොගැනීම |
| (ඇ) | වත්කම් උපයෝජනය | නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවතීම |
| (ඈ) | අයවැය පාලනය | ප්‍රතිපාදන ඉතිරිවීම |
| (ඉ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | විධිමත් ලෙස කසළ බැහැර නොකිරීම |